අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka
+94112785141-50
+94112785818
info@moe.gov.lk
www.moe.gov.lk

මගේ අංකය / எனது இல / My Ref: ED/01/11/04/08(වෙසක්)-2025
ඔබේ අංකය / உமது இல / Your Ref.:
දිනය / திகதி / Date: 2025.04.28

චක්‍රලේඛ අංක : 20/2025

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියලු ම පරිවේණාධිපති ස්වාමීන් වහන්සේලා
සියලු ම සීලමාතා ආයතනාධිපති වහන්සේලා
සියලු ම විදුහල්පතිවරුන්

**ශ්‍රී බුද්ධ වර්ෂ 2569 වන වෙසක් සතිය**

2025 මැයි මස 12 වන දිනට යෙදී ඇති ශ්‍රී බුද්ධ වර්ෂ 2569 වන වෙසක් දිනය නිමිත්තෙන් රාජ්‍ය වෙසක් උත්සවය 2025 මැයි මස 10 වන දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථාන විහාරස්ථානයේ දී පැවැත්වීමට බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇත.

රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව, "වෙසක් සතිය" වැඩසටහන, අදාළ පාසල්, විද්‍යාපීඨ, පිරිවෙන් හා ගුරු විද්‍යාල පරිශ්‍රයන්හි , 2025.05.08 වන දින සිට 2025.05.14 වන දින දක්වා ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු සංවිධානය කළ යුතු වේ.

මෙම වෙසක් සතිය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත ආදර්ශ සැලැස්ම (බුද්ධශාසන ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය සහ බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ නිර්දේශ ද සැලකිල්ලට ගෙන) පහතින් ඉදිරිපත් කර ඇති අතර, එම වැඩසටහන් අදාළ පාසල් සහ අධ්‍යාපන ආයතනවල සුදුසු පරිදි ක්‍රියාත්මක කිරීමට කටයුතු සලසන මෙන් දන්වමි.

**යෝජිත වෙසක් සතියේ ආදර්ශ වැඩ සැලැස්ම.**

| දිනය | තේමාව | යෝජිත ක්‍රියාකාරකම් |
|---|---|---|
| 2025 මැයි මස 08 වන බ්‍රහස්පතින්දා | "Clean Sri Lanka" වැඩසටහනට සමගාමීව පරිසර සංරක්ෂණ වැඩසටහන් හා ශ්‍රමදාන සංවිධානය | • බුදුරජාණන්වහන්සේගේ දර්ශනයට අනුව පරිසර හිතකාමී පිරිසක් බිහි කිරීම සඳහා පරිසරයේ වටිනාකම හා පරිසරය රැක ගැනීම පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>• පාසල, ආයතනය, ආගමික සිද්ධස්ථාන, නිවස ආදියෙහි අවට පිරිසිදු කිරීම සහ වෙසක් පහන් කූඩු (ඉටිකොල භාවිතයෙන් තොරව) සකස් කිරීම සහ සැරසීම. |
| 2025 මැයි මස 09 වන සිකුරාදා | සීල භාවනා සහ ධර්මදේශනා පිංකම් | • අධ්‍යාත්මික සංවර්ධනය සඳහා සිසු සිසුවියන්ට සීල භාවනා/ ධර්ම දේශනා වැඩසටහන් පැවැත්වීම තුළින් ආමිස සහ ප්‍රතිපත්ති පූජා වල ආනිශංස පිළිබඳ අවබෝධය ලබා දීම.<br>• "සති භාවනා" වැඩසටහන් පැවැත්වීම. |
| 2025 මැයි මස 10 වන සෙනසුරාදා. | රාජ්‍ය වෙසක් උත්සවයට සමගාමීව දිවයින පුරා පවත්වනු ලබන වෙසක් සමාරම්භක වැඩසටහන් | • වෙසක් සමාරම්භක ජාතික උත්සවයට සමගාමීව ආගමික වැඩසටහන් පැවැත්වීමට පාසල්/ ආයතන - ප්‍රජාව යොමු කිරීම. |

| | | |
|---|---|---|
| 2025 මැයි මස 11 වන ඉරිදා | සාරධර්ම ප්‍රවර්ධන වැඩසටහන් | • බෞද්ධ සිරිත් විරිත්වල වටිනාකම පිළිබඳ පාසල් හා දහම් පාසල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් හා උපදේශන වැඩසටහන් පැවැත්වීම.<br>• වැඩිහිටි නිවාස, ළමා නිවාස, රෝහල් වැනි සුවිශේෂී ස්ථානවල සත්කාරක වැඩසටහන් පැවැත්වීම. |
| 2025 මැයි මස 12 වන සඳුදා (වෙසක් පුර පසළොස්වක පොහෝ දිනය) | **"කායික වාචසික සංවරය සීලයයි" තේමාව යටතේ විවිධ වැඩසටහන් සංවිධානය** | • වෙසක් පුර පසළොස්වක පොහෝ දිනයේ, දෙමව්පියන් සහ වැඩිහිටියන් සමඟ ආසන්නතම විහාරස්ථානයේ දී හෝ නිවසේදී සිල් සමාදන් වීම හෝ සිල් සමාදන් වූ උවැසි උවැසියන්ට උපස්ථාන කිරීම.<br>• වෙසක් පහන් කූඩු වලින් නිවස අලංකාර කර ආමිස පූජා සිදු කිරීම.<br>• පාසල තුළ වෙසක් බැති ගීත වැඩසටහන් සංවිධානය කිරීම. |
| 2025 මැයි මස 13 වන අඟහරුවාදා | **"සංස්කෘතික වැඩසටහන "** | • වෙසක් බැති ගී ගායනා හා බෞද්ධ නාට්‍ය වැනි සෞන්දර්යාත්මක වැඩසටහන් වැඩිහිටියන් සමඟ සංවිධානය, සහභාගී වීම, නැරඹීම සහ රසාස්වාදයේ යෙදීම.<br>• වෙසක් පහන් කූඩු වලින් නිවස අලංකාර කර ආමිස පූජා සිදු කිරීම. |
| 2025 මැයි මස 14 වන බදාදා | **සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා සම්බුද්ධ දේශනාවන්ට අනුව පවත්වන වැඩසටහන්** | • "සති භාවනා" වැඩසටහන්වලට යොමු වීමට අවස්ථාව ලබාදීම.<br>• නිරෝගීභාවයේ සහ මානසික සුවතාවයෙහි වටිනාකම සිසු සිසුවියන්ට අවබෝධ කර දීමේ වැඩසටහන් සංවිධානය කිරීම.<br>• වස විසෙන් තොර දේශීය ආහාර භෝග වගා කිරීම හා පරිභෝජනයට ගැනිම සම්බන්ධව දේශන හා වැඩසටහන් සංවිධානය කිරීම.<br>• මත්ද්‍රව්‍ය හා දුම්වැටි නිවාරණ වැඩසටහන් සංවිධානය කිරීම. |

ඉහත වෙසක් සතිය තුළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී, ආයතනික වශයෙන් සුදුසු ලෙස කාල වේලාවන් යොදා ගත හැකිය. කුමන හේතුවක් නිසා හෝ බෞද්ධ ආගමට හෝ, යම් ආගමකට නිගරු වන ආකාරයේ අදහස් දැක්වීම, විවිධ සංදර්ශන හා ක්‍රීඩා සහ එවැනි වෙනත් වැඩසටහන් පැවැත්වීම ආදියෙන් වැලකිය යුතු වේ. සිසු සිසුවියන් හා පාසල්/ආයතන ප්‍රජාව අතර ආගමික සංහිඳියාව ගොඩනැගෙන අයුරින් කටයුතු කිරීමට විදුහල්පතිවරුන් සහ ආයතන බලධාරීන්ගේ අවධානය යොමු විය යුතුය.

- ඉහත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හා බෞද්ධ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුව මඟින් ඉදිරියේදී නිකුත් වීමට නියමිත වෙසක් සතිය චක්‍රලේඛයට ද අනුගතව කටයුතු කළ යුතුය.

නාලක කළුවැව
ලේකම්

පිටපත්:
1. ජනාධිපති ලේකම්, ජනාධිපති කාර්යාලය
2. ලේකම්, බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
3. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්

(1–3) කරු.දැ.ගැ .ස හා අ.ක. ස

4. අධ්‍යාපන අධ්‍යක්ෂ (පිරිවෙන්) - සියලු ම පිරිවෙන් අධ්‍යාපන ආයතන දැනුවත් කිරීමට හා අ.ක.ස
5. ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) - සියලු ම විද්‍යාපීඨ වල පීඨාධිපතිවරුන් දැනුවත් කිරීමට හා අ.ක.ස
6. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්) - සියලු ම ජාතික පාසල් වල විදුහල්පතිවරුන් දැනුවත් කිරීමට හා අ.ක.ස